# හීලෑ අලි ඇතුන් සම්බන්ධයෙන් ඇත් ගොව්වාගේ භූමිකාව

**තාරක උමයංග දිල්ශාන් / සමාධි නවෝද්‍යා පීරිස් ***

ශ්‍රී ලංකාවේ පමණක් නොව ලොව ඕනෑම රටක හීලෑ අලි ඇත් සංස්කෘතියේ ප්‍රබල භූමිකාවක් ඇත් ගොව්වන් සතු වේ. සෑම අලියෙක්ට ම නිශ්චිත හිමිකරුවෙකු සිටිය ද අලියා සම්බන්ධ සියලුම කටයුතු සිදුවන්නේ ඇත් ගොව්වා අතිනි. අලියා නැවීම, කෑම සැපයීම, පංතිය පිරිසිදු කිරීම (අලියාගේ ගාල පිරිසිදු කිරීම), අලියා තැනින් තැනට රැගෙන යාම ආදී කටයුතු පමණක් නොව අලින්ට බස හුරු කිරීම, වැඩ පුරුදු කිරීම ආදී වශයෙන් අලියා සම්බන්ධ සියයට හැත්තෑ පහක් (75%) පමණ කාර්යයක් සිදු කරනුයේ ඇත් ගොව්වා විසිනි. සමහර අවස්ථාවලදී අලි හිමියාට වඩා හොඳ අවබෝධයක් ඇත් ගොව්වාට අලියා පිළිබඳව ඇත. එසේම අලියා හා ගොව්වා අතර ඉතා ශක්තිමත් බැඳීමක් ඇත. අලියාගේ හැසිරීම, චිත්ත ස්වභාවය පිළිබඳව ඇත් ගොව්වා නිරන්තර පරික්ෂාවෙන් සිටිය යුතු වේ. අලියාට ආරක්ෂාව සැලසීම, ස්වකීය අරක්ෂාව සලසා ගැනීම, අලියාගෙන් අවට පුද්ගලයින්ට හා දේපලවලට හානි සිදු නොවීමට වගබලා ගැනීම ඇත් ගොව්වාගේ වගකීම් අතර වේ. අලියාගේ පිරිසිදු බව, නිරෝගි බව, කලට වේලාවට ප්‍රමාණවත් පරිදි ආහාර සැපයීම ආදිය පිළිබඳව ඇත් ගොව්වෙකුගේ නිරන්තර අවධානය යොමු විය යුතුය. එසේම හැකි සෑම අවස්ථාවකදීම හැකි උපරිම කරුණාවෙන් අලියාට සැළකීම ද ඇත් ගොව්වා අතින් අනිවාර්යයෙන්ම ඉටු විය යුතු කටයුත්තකි. දරුණු අලි, සැර අලි, මිනී මරු අලි නිර්මාණයවීම සඳහා ඇත් ගොව්වාගේ රළු සැලකිලි බොහෝවිට හේතු පාදක වේ. අලි වෙදකම සුළුවෙන් හෝ ඇත් ගොව්වෙකු විසින් දැනගත යුතු ශාස්ත්‍රයකි. මීට අමතරව නිල ශාස්ත්‍රය, හෙණ්ඩු භාවිතය, වෙළු දැමීම, මංචු ගැසීම, අලි භාෂාව ආදිය ඇත් ගොව්වෙකු දැන සිටිය යුතු මූලිකම අංශ වේ. එසේම නිර්භීත බව, මද රළු ස්වභාවය මෙන් ම මෘදු භාවය යන ගුණාංග ඇත් ගොව්වෙකු සතු විය යුත්තේ ඔහු සිය කාලයෙන් වැඩි ප්‍රමාණයක් තිරිසන් සත්ත්වයෙකු සමග ගත කරන බැවිනි. මනා සිහි බුද්ධියකින් සෑමවිටම සිටීම ඇත් ගොව්වෙකුට අනිවාර්ය වේ. මක්නිසාද යත් ඔහුගේ එක් මොහොතක ප්‍රමාදයකින් තම ජීවිතය හෝ අලියාගේ ජීවිතය අනතුරට ලක්විය හැකි බැවිනි.

ඇත් ගොව්වා යනු වෙන් වෙන් වශයෙන් අවධානය යොමු කළ යුතු අංශ රැසකින් සමන්විත හීලෑ අලි ඇත් සංස්කෘතියේ ප්‍රබල අංගයකි.

අලි ඇතුන් ප්‍රඥාවන්තය ශක්තිමත්ය. එසේ වුව ද අලි ඇතුන් මෙල්ල කරගැනීමට ඇත් ගොව්වා සමර්ථය. අලි ඇතුන්ට ඇත් ගොව්වා දක්වන ආදරය කරුණාව සහ ගෞරවය උන් ඇත් ගොව්වාට පෙරලා ලබාදෙයි. කැලයේ සිට අල්ලාගෙන එන අලියා හා සබඳතාවයක් ගොඩනගා ගැනීමට ඉතාමත් සූක්ෂමව ඇත් ගොව්වන් ක්‍රියාකරයි. වනයේ සිට අල්ලාගෙන එනු ලබන හස්තියා හිමිකරුගේ භූමිය වෙත රැගෙන ආ පසු දිය නැහැවීම ආදී කටයුතුවලට රැගෙන යනුයේ හීලෑ

---

* තාරක උමයංග දිල්ශාන් / සමාධි නවෝද්‍යා පීරිස්
ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය, පුරාවිද්‍යාව - කැලණිය විශ්වවිද්‍යාලය,

අලින්ගේ කරේ ඇඳීමෙනි. එවිට වන අලියාට ඇසෙන්නට කථා කරමින් පිටු පසින් ඇත් ගොව්වා ගමන් කරයි. අලියාගේ ක්‍රියාවන් හමුවේ ඊට සුදුසු වචන භාවිතා කරමින් උස් හඬින් කථා කිරීම සිදුකරයි. එවිට අලියා ක්‍රමයෙන් අලි භාෂාවට හුරුවීම සිදුකරයි. ඒ වගේම ඇත් ගොව්වා විසින් පිට පුරුදු කිරීම ද (අලියාගේ පිට මත නැග කටයුතු කිරීමට) ඉතා සූක්ෂමව සිදුකර ගනී. මේ සඳහා යම් කාලයක් ද ගත වේ. අලිය ප්‍රිය කරන ආහාර ආදිය ලබාදෙමින් මේ කටයුතු සිදුකර ගැනීමට ඇත් ගොව්වන් ක්‍රියා කරයි. පළපුරුදු ඇත් ගොව්වෙකු වනුයේ අලි බස භාවිතා කරමින් අලියෙකු හැසිරවීමෙන් පමණක් නොවේ. ඒ සඳහා විශාල සුදුසුකම් ප්‍රමාණයක් ඇත් ගොව්වා විසින් සැපිරිය යුතු ය. අලියෙකුගේ පොඩි වෙනස් කමක් වුව ද හඳුනාගැනීමට හැකියාව තිබිය යුතුය. විශේෂයෙන් අලි වෙදකම පිළිබඳව අවබෝධයක් ලබා තිබිය යුතුය. අලි ඇතුන් සඳහා නිරන්තරයෙන්ම වැලඳෙන බඩේ අමාරු ආදි රෝගාබාධ සඳහා අත් බෙහෙත් ආදිය ද අලි ඇතුන්ට වැලඳෙන රෝගාබාධ සඳහා වූ රෝග ලක්ෂණ පිළිබඳ අවබෝධයක් ද ඇත් ගොව්වන් සතු විය යුතු ය. අතීතයේ ඇත් ගොව්වන් නැතහොත් අලි හිමියන්ගේ ආමන්ත්‍රණයට අනුව අලි බාසුන්නැහේලා පාරම්පරික අලි වෙද මහතුන් ළඟ සේවය කොට අලි වෙදකම පිළිබඳව හැදෑරීම සිදුකරයි. දැනට ශ්‍රී ලංකාවේ සිටින ඇත් ගොව්වන්ගෙන් බහුතරයක් නොවුනත් සුළුතරයක් පාරම්පරිකව මෙම කටයුත්තට යොමු වී ඇති බව පෙනේ. ඒ අය මේ ශාස්ත්‍රය සිය ඉහළ පරම්පරාවෙන් හදාරා ඇත. එහෙත් බහුතරය සිය ආසාවට කැමැත්ත මත හීලෑ අලි ඇතුන් හා පරිණත ඇත් ගොව්වන් පසු පස යමින් ඔවුනට අත් උදව් සපයමින් ශාස්ත්‍රය ඉගෙන ගෙන ඇත. ලාංකික ඇත් ගොව්වන්ගේ ශාස්ත්‍රය තුළ ඇති වැදගත් අංගයක් වනුයේ නිල ශාස්ත්‍රයයි. හඬින් විධාන නොදී හස්තියාගේ නිලවලට තට්ටු කරමින් හස්තියා හැසිරවීමට ලාංකික ඇත් ගොව්වා සමත්වේ. ඔවුන් සතුව පවතින අනෙක් වැදගත්ම දෙය වනුයේ හෙණ්ඩුවයි. මෙයද ඔවුන් නිර්මාණය කරනුයේ ශාස්ත්‍රයකට අනුව සුභ මූර්ති බලා ය. හෙන්ඩු පණ පෙවීම ආදී කටයුතු ඔවුන් සිදුකරනුයේ ඒ ආකාරයෙනි. වර්තමානයේ භාවිතය මෙන්ම ඇත්ගොව්වන් සතුවද, දැඩිලෙස නොමැති වුව ද අතීතයේ සිටි ඇත්ගොව්වන් දැඩි ලෙස විශ්වාස කළ දෙයකි අලි මන්ත්‍ර. ඔවුන් බොහෝ කටයුතු සිදු කළේ අලි මන්ත්‍ර මූලික කරගෙන වීම විශේෂ දෙයකි. වර්තමානයේ දැඩි ලෙස භාවිතා නොවූව ද අදටත් ජීවත්ව සිටින පරිණත පලපුරුදු ඇත් ගොව්වන් අලි මන්ත්‍ර යම් යම් දේ සම්බන්ධව භාවිතයට ගන්නා බවට ඔවුන් හෙළි කරයි.

අලි බාසුන්නැහේ එසේත් නැතිනම් අලිකාරයා ලෙස ද හඳුන්වනු ලබන ඇත් ගොව්වන් ගත කරනුයේ යම් අවධානමක් සහිත ජීවිතයකි. ඇතින්නක බලන ඇත් ගොව්වාට වඩා අලියෙකු ඇතෙකු වැනි පිරිමි සත්ත්වයෙකු සමඟ කටයුතු කරන අය යම් අවධානම් තත්ත්වයකට යොමු වනුයේ මද කිපෙන කාලය තුළය. එහෙත් එම කාලය තුළ මාස කිහිපයක් එකතැන ගස් බැඳ තබන සත්ත්වයාට ඔවුන් ආහාර හා වතුර ලබා දෙමින් ද විෂබීජ නාශක යොදමින් දංවැල් අඩියද පිරිසිදු කිරීම සිදුකරයි. පෙරහැර ආදී සංස්කෘතික කටයුතුවලට සහභාගීවෙන අලි වෙනුවෙන් ඔවුන් හට හාම්පුතුන්ට ලැබෙන මුදලින් කොටසක් ලබා දීමට බොහෝ අලි හිමියන් ක්‍රියාකරනු ලබයි. ඊට අමතරව සංචාරක කර්මාන්තයට යොදවා සිටින අලි ඇතුන්ගේ ඇත් ගොව්වන් සිය මාසික වැටුපට අමතරව මුදල් සෙවීමත් සිදු කරයි. කෙසේ වුව ද මොවුන් ආර්ථික වශයෙන් ශක්තිමත්

හා දැඩි පුද්ගලයන් නොවෙයි. සමාජයෙන් ඔවුන් වෙත චෝදනා එල්ල වන අවස්ථාවන් වේ නම් ඒ ඔවුන්ගේ මත් භාවිතයයි. ඔවුන් ගත කරන ජීවිත ස්භාවය අනුවත් සමාජීය මට්ටම අනුවත් එය සිදු කළ ද එය සාධාරණීය කළ නොහැක්කකි. නමුත් සිටින සියලුම ඇත් ගොව්වන් මත් ද්‍රව්‍ය භාවිතා කරනවා යැයි පැවසීම මුසාවකි. පෙරහැර අවස්ථාවලදී ඇතුළුව අලි ඇතුන් කුලප්පු වන අවස්ථාවල ඇත් ගොව්වන් මුහුණ දෙනුයේ දැඩි අසීරුතාවයකටය. එමෙන්ම ජීවිත අවධානමකය. පුද්ගල ජීවිතවල මෙන්ම හස්තියාගේ සුරක්ෂිතතාවය පිළිබඳව ද දැඩිව සිතා කටයුතු කිරීම පැසසිය යුතු තත්ත්වයකි.